
# 23 අපේ වැව්



ආ..... සරලා එන්න එන්න.

ඔයා ආවේ **කොයි වෙලාවේ** ද?

මාත් **දැන්** තමයි ආවේ.

**ඉතිං** කොහොම ද තොරතුරු?

හොඳින් ඉන්නවා.

අපි පන්තියට යමු ද?

**හා හොඳයි** යමු.

ඔයා උදේට කෑවා ද?

නෑ... නෑ අපි එහෙනම් කමු ද?

**හා හොඳයි** කමු.

ඒක නෙවෙයි සරලා, ඔයා අද පාඩමට වැව් ගැන තොරතුරු හොයාගෙන ආවා ද?

**අයියෝ !** මට එච්චර හොයා ගන්න වුණේ නෑනේ.

**ඒත්** පත්තර වගයක් කියවලා තොරතුරු ටිකක් හොයා ගත්තා.

මට නං **ඊයෙ** හොඳ දවසක් වුණා.

**ඇයි අනේ !** ඒ ?

අපේ අයියා එයාගෙ පාඩම් පොත කියවනවා මා අහගෙන හිටියා.

ඒ පාඩමේ තිබුණේ වැව් ගැන තොරතුරු

**කොයි** රටේ ද ඒවා තියෙන්නේ?

**ඇයි, අනේ !** වැව් බැඳි රටේ නෙ ඒවා තියෙන්නේ.

වැව් බැඳි රට කිව්වේ ?

**ඇයි අනේ !** රජ රට නේ. එහේ නේ වැව් ගොඩක් තියෙන්නේ.

**ඉතිං** මොනවා ද ඔයා හොයාගත්ත තොරතුරු?

ඔයා දන්නවා ද? ලංකාවේ රජ කෙනෙක් කරවපු මුල් ම වැව මොකක් ද කියලා?



අනුරාධපුරේ තියන බසවක්කුලම වැව **ලු** නේ ද මුලින් **ම** කරපු වැව?

ඔව්, ඔව්, අභය වැව කියන්නෙත් ඒකට **ම** නේ.

**හා,** බලන්න කියන්න කවුද ඒ වැව හැදුවේ?

පණ්ඩුකාභය රජ්ජුරුවො ලු නේ ද ඒ වැව හැදුවේ?

ඒක පළමුවෙනි වැව කිව්වට ඊට ඉස්සර වැව් තිබුණෙ නැද්ද?

මෙයත් හරි කෙනා තමයි. **ඇයි** දන්නේ නැද්ද?

පොඩි පොඩි වැව් තිබුණා තමයි. ඒවට නේ "ගම් වැව්" කියලා ඉස්සර කියලා තියෙන්නේ.

ඒත් වේල්ලක් බැඳලා සොරොව්වකින් වතුර ගත්තේ ඉස්සෙල්ල ම ඒ වැවෙන් තමයි.

සොරොව්ව කියන්නේ මොකක් ද? අනේ!

අපෝ! ඔයා ඒකවත් දන්නේ නැති ද? වැවේ ඉඳලා වතුර බහින්න හදන කපොල්ල තමයි සොරොව්ව කියන්නේ.



අනුරාධපුරයේ තියෙන තවත් වැව් වගයක් ගැන අයියා කියවනවා මම අහගෙන.

මොනවා ද අනේ ඒ වැව්?

ඇයි තිසා වැව, නුවර වැව වගේ ඒවා. ඇයි පොළොන්නරුවෙ "පරාක්‍රම සමුද්‍රය", මින්නේරියෙ "මින්නේරිය වැව" ඒවත් ලොකු වැව් තමා.

## ක්‍රියාකාරකම : 1

කළු කර ඇති පද හඳුනා ගන්න. ඒවා පොතේ ලියන්න.

- ✸ අපි කමු ද ?
- ✸ ඔයා ආවේ **කොයි** වෙලාවේ ද?
- ✸ **අයියෝ!** මට එච්චර හොයාගන්න ලැබුණේ නැහැ.
- ✸ අනුරාධපුරයේ තියන බසවක්කුලම වැව **ලු**.
- ✸ මං නං රෑවෙන **තුරු** කියෙව්වා.
- ✸ **අපෝ** ඔයා ඒකවත් දන්නෙ නැද්ද?

ඉහත වාක්‍යවල කළු කර ඇති පද ඉවත් කළොත් වාක්‍යයෙන් කියැවෙන අදහස අපැහැදිලි වේ. ඒ නිසා ඒ පදවල වටිනාකම වැඩි ය. එවැනි පද විශාල ගණනක් භාෂාවේ භාවිත වේ. ඒ පද වාක්‍යවල යෙදීමෙන් අරුත් සහිත රසවත් වාක්‍යයක් ගොඩනැගීමට හැකියාව ලැබේ. වාක්‍යයක මුල, මැද, අග මේ පද යෙදේ. එම පද අනෙක් පදවලින් වෙන් කර ලිවිය යුතු වේ.

## ක්‍රියාකාරකම : 2

දී ඇති වාක්‍යවල හිස්තැනට යෙදෙන පද පාඩමෙන් උපුටා ලියන්න. ශබ්ද නගා කියවන්න.

උදා : ඔයා උදේට කෑව ද?

i. ................................................ ඒව තියෙන්නේ.

ii. .......................................... වැව් බැඳි රටේ නේ ඒවා තියෙන්නේ.

iii. පණ්ඩුකාභය රජ්ජුරුවෝ .............................................. .

iv. අපි පන්තියට යමු ..............................................?

v. .......................................... අභය වැව කියන්නෙත් ඒකට නේ.

vi.. ...................................... මොනව ද ඔයා හොයා ගත්ත තොරතුරු?

vii. ................................................ ඔයා ඒකවත් දන්නැද්ද?

viii. ...................................... තිසා වැව, නුවර වැව වගේ ඒවා.

## ක්‍රියාකාරකම : 3

දී ඇති පද අතරින් සුදුසු පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

උදා : අපි පන්තියට යමු ද?.

i. හෙට නැන්දලා එනවා ........................................ අපේ ගෙදර. ( හා, ලු )

ii. ........................................ ! එයා හරියට මහත්වෙලා. ( අපෝ , එපා )

iii. අපි තුනට විතර යමු ........................................ ? ( වගේ, ද )

iv. රවි හෙට වැඩට යන්නේ ........................................ වේලාවේ ද? (කීයට, කොයි)

v. එයා නං අද නැටුවා ........................................ හොඳට ම. (ගොඩක්, නේ ද)

vi. ඊයෙ උදේ ........................................ වැස්සා නේ (පටන්, විතර)

vii. සරලා ........................................ මධුරි වැව් බලන්න ගියා. (සමග, ලෙස)

viii. ........................................ ! එයාට වෙච්ච දේ. (අනේ, ඇයි)

## ක්‍රියාකාරකම : 4

සුදුසු පදය තෝරා වාක්‍ය සම්පූර්ණ කර ලියන්න.

i. මං ඔයා එන .................... ඉන්නම්

ii. නගරයට උදේ .................... වැහැලා තිබුණා.

iii. .................... ! එයාට වෙච්ච දෙයක්.

iv. කොහොම .............................. මං දිනනවා.

v. සිංහයො ඉන්නේ .............................. රටේ ද?

vi. ඇත්තට ම ඔයා දිනුවා .............................. ?

vii. නයා .............................. මුගටියා සටන් කරනවා.

viii. අද හවස මාමලා එනවා .............................. .

( කොයි, තුරු, ද , ලූ , අයියෝ , හරි , දක්වා , හා, පටන් )

පහත දැක්වෙන වාක්‍ය කියවන්න.

- ✷ ඔයා කෑම කෑවා ද?
- ✷ ඔයා කෑවේ **මොනවා** ද?
- ✷ ඔයා කෑවේ **මොන** කෑම ද?
- ✷ **මොන මොන** කෑම ද ඔයා කෑවේ?

එම පද වාක්‍යයේ මුල, මැද, අග යෙදෙන රටාව හඳුනා ගන්න. මේ වාක්‍ය ද කියවන්න.

ඔයා රචනා ලිව්ව ද?

ඔයා ලිව්ව රචනා **මොනවා** ද?

ඔයා ලිව්වෙ **මොන** රචනා ද?

**මොන මොන** රචනා ද ඔයා ලිව්වෙ?

## ක්‍රියාකාරකම : 5

ඉහත වාක්‍ය අනුව පහත දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.

i.
- ✷ රමණී පාඩම් කළා ........................................... ?
- ✷ රමණී කරපු පාඩම් .................................................. ද?
- ✷ රමණී කළේ ............................................ පාඩම් ද?
- ✷ ........................................... පාඩම් ද රමණී කළේ.

ii.
- ✷ කමල් ගීත ගැයුවා ........................................... ?
- ✷ කමල් ගයපු ගීත ........................................ ද?
- ✷ කමල් ගැයුවේ ............................................. ගීත ද?
- ✷ ........................................... ගීත ද කමල් ගැයුවේ?